**පුත්තලම නගර සභාව - 2020**

------------------------------------

**1.** **මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **තත්ත්වාගණනය කළ මතය**

-------------------------------

පුත්තලම නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට පුත්තලම නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (IV) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට රු.70,710,468ක් වූ වෙනත් ණයගැති වටිනාකමට අදාළව ලැබීම් හා ණයගැති වෙන්කිරීම් සඳහා සැසඳීම සිදුකර අධි හෝ ඌන ණයගැති වෙන්කිරීම් හඳුනාගෙන ඒවා ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | 2018 වර්ෂයට පෙර ණයගැති වටිනාකම් සම්බන්ධ ගැලපීම් සිදුකිරීම සඳහා අවශ්‍ය තොරතුරු පරීක්ෂා කරමින් පවතී. වැටුප් ප්‍රතිපූර්ණ සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස් හා ප්‍රධාන ලේකම් වෙත ඉල්ලීම් කර ඇති අතර මුදල් ප්‍රතිපාදන ලැබූ සැනින් එම මුදල් නිදහස් කරන බව දන්වා ඇති අතර පසුව වාර්තා කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවක ඇප තැන්පත් ගිණුම හා සේවක ඇප ආයෝජන ගිණුම අතර රු.36,108ක වෙනසක් පැවතුණි. | වෙනස්කම් නිවැරදිව හඳුනාගෙන 2021 අවසන් ගිණුමේදී ගැලපීම් කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දිනට ගිණුමට අනුව තොගය ( ලිපි ද්‍රව්‍ය , වීථිපහන් උපකරණ යන ආදී තොග) රු.20,192,385ක් වූ අතර තොගය භෞතිකව ගණනය කර ගිණුම්වලට ගැලපීම් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ සිට අවසන් තොගය භෞතිකවද ගණනය කර ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කරමි. | භෞතිකව තොග ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඈ) | 2018 දෙසැම්බර් 31 දින නගර සභාව සතු ගබඩාව ගිනි ගැනීමෙන් විනාශ වී තිබූ රු.2,433,668ක තොගයේ තොග අලාභය හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | විනාශ වූ තොගයේ අලාභය 2021 වර්ෂයේ අවසන් ගිණුම සැකසීමේ දී ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කිරීමක් සිදුකළ යුතු අතර තොග අලාභය හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2020 දෙසැම්බර් 31 දිනට වූ වෙනත් වියදම් ණයහිමි වටිනාකමින් පූර්ව වර්ෂයට හා ඊට පෙර වර්ෂයන්ට අදාළවූ රු.31,091,243ක වටිනාකම තුල ඇතුළත් ඌන හා අධි ණයහිමි වෙන්කිරීම් වටිනාකම (ණයහිමි වෙන්කිරීම් හා තථ්‍ය ගෙවීම් අතර වෙනස) හඳුනාගෙන ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි. | තොරතුරු ලැබෙමින් පවතින අතර 2021 අවසන් ගිණුම් සකස් කිරීමේදී ගැලපීම් කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඊ) | ස්ථාවර වත්කම් ලේඛනයට අනුව නගර සභාව සතු ගොඩනැගිලි හා ඉදිකිරීම් අයිතම 26ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | දේපළ තක්සේරු කර ගැනීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කොට ඇත. | කඩිනමින් තක්සේරු කර නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (උ) | නගර සභාව විසින් නීතිමය ක්‍රියාමාර්ගවලට එළඹ ඇති නඩු 03 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණු අතර මෙම නඩු 03 සම්බන්ධයෙන් මේ වන විට රු.542,000 ක වියදමක් දරා ඇත. | 2021 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේදී මේ සම්බන්ධයෙන් තොරතුරු හෙළිදරව් කිරීමට කටයුතු කරමි. | නඩු සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |
| (ඌ) | ඇල්ෆා වෙළඳ සංකීර්ණය ඉදි කිරීමට අදාළව උපදේශක සමාගමට හා කොන්ත්‍රාත්කරු වෙත ගෙවන ලද රු.203,778,441ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. එමෙන්ම වෙළඳ සංකීර්ණයේ කඩකාමර වෙන්කරදීම වෙනුවෙන් 2019 හා 2020 වර්ෂවල පිළිවෙලින් එකවර ලැබුණු (Key Money) රු.98,271,601 ක් හා රු.11,050,000 ක මුදල් ආදායම් හඳුනාගැනීමේ ක්‍රමවේදයකට අනුව එක් එක් වර්ෂයේ ආදායමක් ලෙස හඳුනානොගෙන මුදල ලැබුණු වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ප්‍රාග්ධනිත කර නොමැති වියදම ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරමි. ලද හා ලැබිය යුතු මුදල් සම්බන්ධව විගණන හා කළමණාකරන කමිටුවේදී සාකච්ඡා කර විසඳුම් ලබා ගැනීමට බලාපොරොත්තු වන අතර අනෙකුත් අඩුපාඩු 2021 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | වර්ෂයට අදාළ ආදායම් වියදම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කල යුතුවේ. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 03 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම හා උපලේඛන අනුව වටිනාකම අතර රු.508,761 ක වෙනසක් පැවතුණි. | උපලේඛන අනුව වෙනස් වීමට හේතු වූ කරුණු සොයා නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.121,442,913 ක්වූ ගිණුම් විෂයන් 13 ක් විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | අවශ්‍ය ලේඛන සහ වාර්තා නිළධාරීන් මඟින් ගෙන්වා ගෙන ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,322,452ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.145,727,308ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් බිල් කළ වරිපනම් බදු මුදලින් රු.15,764,000 ක මුදලක් අයකර ගත යුතුව ඇත. සමාලෝචිත වර්ෂය අවසානයට සමස්ථ වරිපනම් බදු හිඟය රු.91,841,929 කි. තවද 2018 සිට 2020 වර්ෂය දක්වා අනුමත කර තිබූ ගොඩනැගිලි සඳහා වාර්ෂික වරිපනම් සංශෝධනයකින් තොරව අඩු වටිනාකමක් අය කෙරෙමින් පැවතුණි. | සියලු දුෂ්කරතා මධ්‍යයේ වුවද රු.7,109,000ක මුදලක් රැස්කල අතර සීමිත නිළධාරීන් පිරිසක් සේවයේ නියලී කටයුතු කල හෙයින් හිඟ ආදායම් අයකර ගැනීමට නොහැකි වී ඇත. තවද ගොඩනැගිලි සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු කර එම අගයන් ලබාදුන් පසු අදාල වටිනාකම් අය කරමි. | නිවැරදි තක්සේරු මත හිඟ වරිපනම් කඩිනමින් අයකල යුතුවේ. |

### (ආ) වෙනත් ආදායම්

| | | |
|---|---|---|
| හිඟ හිටි වෙනත් ආදායම් උපලේඛනය අනුව මුද්දර ආදායම් ලෙස රු.2,154,128ක්ද, සාප්පු කුලී ලෙස රු.5,429,663ක්ද, ටෙන්ඩර් ආදායම් ලෙස රු.1,029,527ක්ද, උසාවි දඩ ලෙස රු.729,185ක්ද හා දෛනික පොල ගාස්තු ලෙස රු.2,899,600 ක්ද වශයෙන් එකතුව රු.12,242,103 ක් වර්ෂ 03කට වැඩි කාලයක සිට හිඟව පැවති අතර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුද්දර ගාස්තු මුදල් සභාවට අයවිය යුතු මුදලක් නොවන බව දන්වා සිටිමි. හිඟ කඩ කුලී පසුගිය කාලය පුරාවට විවිධ වැඩ සටහන් සංවිධානය කර අයකිරීමට කටයුතු කල අතර ඉදිරියේදී පවතින හිඟ අවම කර ගැනීමට කටයුතු කරමි. ටෙන්ඩර් ආදායම් තවදුරටත් ලේඛන සොයා බලා අවශ්‍ය කපා හැරීම් සිදු කිරීමට හෝ අය කර ගැනීමට අවශ්‍ය නීතිමය පියවර ගන්නා බව දන්වමි.<br>උසාවි දඩ සභාව වෙත ලැබී නොමැති බවත්, ඉදිරියේදී මෙම මුදල ඉවත් කර ගැනීමට අවශ්‍ය අනුමැතිය ලබා ගෙන ශේෂය ඉවත් කිරීමට කටයුතු කරමි.<br>දීර්ඝ කාලයක සිට අවසන් ගිණුම් තුළ පෙන්නුම් කරනා දෛනික පොළ ගාස්තු හිඟ මුදල සම්බන්ධව ලේඛන සොයා ගැනීමේ අපහසුතාවයක් පවතින බවත් එසේ වුවද තවදුරටත් එම ලේඛන සොයා බැලීමට කටයුතු කරමි. | හිඟ හිටි වෙනත් ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

නගර සභා පනත 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශේෂ අත්තිකාරම් ලෙස ලබාදී වර්ෂ 15 ඉක්මවා තිබූ රු.223,656ක අත්තිකාරම් පියවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම අත්තිකාරම් කපා හැරීම සඳහා මහසභාවට යෝජනා ඉදිරිපත් කර ඇති අතර එහි තීරණ අනුව ඉදිරියේදී අදාළ කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරමි. | හිඟ අත්තිකාරම් කඩිනමින් අයකර ගත යුතු වේ. |

## 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 ජනවාරි 01 දින සිට එකතු කළ අගය මත බදුවලින් නගර සභාව නිදහස් කර තිබූ බැවින් 2020 දෙසැම්බර් 31 දිනට තව දුරටත් හිලව් කළ නොහැකි වූ එකතු කළ අගය මත බදු ගිණුමෙහි වූ රු.7,365,831ක හර ශේෂය සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2021 අප්‍රේල් 28 දින දේශිය ආදායම් දෙපාර්තමේන්තුව විසින් එවූ ලිපියේ සඳහන් පරිදි කරුණු සාකච්ඡා කර අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරමි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබාගෙන අවශ්‍ය නිරවුල් කිරීම් සිදුකළ යුතුවේ. |

## 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේඅදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නගර සභාව සතු ඉඩමක නාගරික සංවර්ධන අධිකාරිය විසින් හෙළ බොජුන් හලක් සඳහා ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණු අතර ඒ වෙනුවෙන් නගර සභාව විසින් ජල ටැංකිය සඳහා කුළුණක් ඉදිකිරීමට රු.863,051ක වියදමක් දරා තිබුණි. එම ගොඩනැගිල්ල නගර සභාව වෙත පවරා ගැනීමට කටයුතු කළ බවට ලිඛිත සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොවූ අතර විගණිත දින වන විටද මෙම ගොඩනැගිල්ල නිශ්කාර්යව පැවතුණි. එමෙන්ම ඉදිකල ජල ටැංකිය ද නිශ්කාර්යව පැවතුණි. | නුදුරේදීම එකී හෙළ බොජුන්හල ගොඩනැගිල්ලත් එය පිහිටා ඇති භූමියත් පුත්තලම නගර සභාව වෙත පවරා දීමට කටයුතු කරනු ලැබේ. එමෙන්ම ජල ටැංකිය ද ස්ථාන ගත කර එම කාර්ය ඉටු කිරීමට කටයුතු කරමි. | අදාළ ගොඩනැගිල්ල නගර සභාව වෙත පවරා ගනිමින් ආදායම් උත්පාදන කාර්යය සඳහා කාර්යක්ෂමව යෙදවිය යුතුවේ. |